# විපක්ෂ නායක - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
## எதிர்க்கட்சித் தலைவர் - இலங்கைப் பாராளுமன்றம்
## LEADER OF THE OPPOSITION - PARLIAMENT, SRI LANKA

2026.10.10

ගරු කථානායකතුමා මගින්
සභාපති,
රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව

**බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග ක්‍රියාත්මක කිරීම සම්බන්ධවයි.**

විවිධ හේතූන් මත දඬුවමකට ලක්ව බන්ධනාගාර ගත කරන මහා සංඝරත්නය ඇතුළු අන්‍ය ආගමික පූජ්‍ය ප්‍රසාදීන් වහන්සේලා බන්ධනාගාරයේ රඳවා සිටින විට සහ බන්ධනාගාරයෙන් පිටතට රැගෙන ඒමේදී පැළඳිය යුතු වස්ත්‍රය පිළිබඳව බරපතළ කතිකාවක් නිර්මාණය වී ඇත. විශේෂයෙන්ම බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිත්‍ය නියෝග අංක 550 අනුව මහා සංඝරත්නය ඇතුළු අන්‍ය ආගමික පූජ්‍ය පක්ෂයට එම නියෝග ක්‍රියාත්මක කිරීමේදී ක්‍රියාකළ යුතු ආකාරය මත බේදාත්මක තත්වයක් මතුකොට තිබේ.

මෙම ගැටලුව විසඳීමට රජය කඩිනම් හා සාධනීය මැදිහත්වීමක් සිදු නොකරන බවට හැඟී යන තත්ත්වයක් හමුවේ රට තුළ මහජනතාව දැඩි කම්පනයකට ලක්කොට ඇත.

එබැවින්, එකී නියෝග නැවත සලකා බැලීම හා අවශ්‍ය සංශෝධනයන් සිදු කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම ව්‍යවස්ථාදායකය සතු වගකීමක් බව සඳහන් කරනු කැමැත්තෙමි.

ඒ උදෙසා මෙම විෂය පථයට අදාළ රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව කඩිනමින් කැඳවීමට පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිමි. එසේම, එහි පළමු රැස්වීමටම පහත පාර්ශ්ව කැඳවීමට කටයුතු කරන්නේ නම් මැනවි.

1. අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
2. බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
3. බන්ධනාගාර දෙපාර්තමේන්තුව
4. නීතිපති දෙපාර්තමේන්තුව
5. අදාළ අනෙකුත් සියලුම පාර්ශ්ව

පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, ශ්‍රී ලංකාව / பாராளுமன்றம், ஸ்ரீ ஜயவர்தனபுர கோட்டே, இலங்கை / Parliament, Sri Jayewardenepura Kotte, Sri Lanka.
දුරකථන/தொலைபேசி/Telephones : +94 (0)11 2777253/+94 (0)11 2777261 විද්‍යුත් තැපැල/மின்னஞ்சல்/E-mail : sajith_p@dialogsl.net ෆැක්ස්/தொலைநகல்/Fax : +94 (0)11 2777257

වැඩිදුරටත්, මම මෙම කාරක සභාවේ සාමාජිකයෙකු නොවුවද, මෙම සංවේදී ගැටලුවේ ඇති ජාතික වැදගත්කම සලකා අදාළ රැස්වීමට සක්‍රීයව සහභාගී වීමට (යෝජනා හා අදහස් ඉදිරිපත් කිරීමට) අපේක්ෂා කරමි. ඒ සඳහා අවශ්‍ය අවසර ලබාදෙන ලෙස ද ඉල්ලා සිටිමි.

සජිත් ප්‍රේමදාස (පා.ම)

විපක්ෂ නායක

පිටපත්: රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව නියෝජනය කරන විපක්ෂයේ සියලුම මන්ත්‍රීවරුන්